දෙසැම්බර් 15 දින ලංකාදීප පුවත් වාර්තාවක දැක්වී තිබුණේ තරුණයෙකුට පහර දී තුවාල කිරීමේ සිදුවීමක් සහ "ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම් සහ මහා මාර්ගයේ සිදුකරන අමානුෂික පහරදීම් ආදී වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා සැකකරුවන්ගේ ඡායාරූප මින් ඉදිරියට මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කෙරේ" යැයි මහජන ආරක්ෂක අමාත්‍ය සරත් වීරසේකර විසින් සිදුකළ ප්‍රකාශයයි. මෙහි අදාළ සිදුවීමේ සැකකරුවන්ගේ ඡායාරූපද පළ වී තිබුණි. එම ඡායාරූප අමාත්‍යවරයාගේ නියමයෙන් පොලිසිය විසින් මාධ්‍ය වෙත මුදාහැර ඇති බවද සඳහන්ව තිබිණි.

ඒ සම්බන්ධයෙන් සංවාදයක් ඇති කිරීම සඳහා අපි පහත පැනයන් ඔබ වෙත ඉදිරිපත් කර සිටිමු.

1) නීතිය ඉදිරිපිට වරදකරුවෙකු බව සනාථ කරන තුරු සැකකරුවෙකු නිර්දෝෂ යැයි පූර්ව නිගමනයක් යටතේ කටයුතු කිරීම ඕනෑම පුද්ගලයෙකුගේ අයිතියකි. එවන් විටක සැකකරුවෙකුගේ ඡායාරූප මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කිරීම නිසා, තවමත් නීතියෙන් වරදකරුවෙකු නොවූ අයෙකු හට සමාජ ගර්හාවට හා අපකීර්තියට මුහුණ දීමට සිදුවේ. එසේ නම්, මහජන බැඳියාව හා ගැටුමක් ඇති නොවන අවස්ථාවන්හිදී සැකකරුවෙකුගේ ඡායාරූප ප්‍රසිද්ධියට පත් කරනා මාධ්‍ය භාවිතාවක් මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවනු ඇතිද?

2) එසේම මාධ්‍ය තුළ ඡායාරූප පළ වීම ඔස්සේ උසාවි තීන්දුවටද පෙරාතුව සමාජ අපකීර්තියකට ලක් කෙරෙනා සැකකරුවෙකු යම් හෙයකින් නීතිය ඉදිරියේ නිර්දෝෂී වන්නේ නම්, ඊට සමාන ප්‍රසිද්ධියක් එම පුවතට මාධ්‍ය මගින් ලැබෙනු ඇතිද?

මේ අනුව සැකකරුවන්ගේ ඡායාරූප මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කිරීමේ ප්‍රවේශය කෙතරම් ආචාර ධර්මානුකූල වන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

මූලාශ්‍ර:
https://www.inbrief.co.uk/.../media-identification-of.../
https://ethics.journalists.org/.../naming-criminal-suspects/

**#MediaEthicsSL #lka #SinhalaPress#Lankadeepa**